# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/02/16 | ඔබේ අංකය / உமது இல / Your No: .................... | දිනය / திகதி / Date: 2023.09.20 |

ප්‍රධාන කාර්යාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>නිවැරදි දත්ත හා තොරතුරු ඉදිරිපත් කිරීම.</u>**

රජයේ කැබිනට් අමාත්‍යාංශයක් ලෙස මෙන්ම රාජ්‍ය ආයතනයක් ලෙස අමාත්‍යාංශය මඟින් ප්‍රසිද්ධියට පත් කරන හා විවිධ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඉදිරිපත් කරන දත්ත හා තොරතුරුවල නිවැරදිභාවය හා පැහැදිළිභාවය තහවුරු කිරීමට දත්ත ඉදිරිපත් කරන ආයතන මුළුමනින්ම බැඳී සිටී.

02. විශේෂයෙන් ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පාර්ලිමේන්තුව, විගණන දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලබන තොරතුරු වඩාත් තීරණාත්මක හා සංවේදී වන බැවින් ඒ කෙරෙහි උපරිම අවධානය යොමු කරමින් කිසිදු අඩුපාඩුවකින් තොරව නිවැරදි දත්ත හා තොරතුරු ඉදිරිපත් කිරීම අතිශයින්ම වැදගත් වේ.

03. ඉහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔබගේ කාර්ය මණ්ඩලය ද දැනුවත් කර ඔබ ආයතනයෙන් ලබාදෙන සියළු දත්ත හා තොරතුරුවල නිවැරදිභාවය හා පැහැදිළිභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් මෙයින් උපදෙස් දෙමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගයකොට සළකමි.

ආර්.පී.කේ. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත:-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |